# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2304/13 - 2022 ඔක්තෝබර් මස 31 වැනි සඳුදා - 2022.10.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය:* තිප්‍රාලේ/1/8/3/62 අත්.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය:* 4-3/2/2017/BIO/281.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ 1 වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ග්‍රෑන්ඩ් හයිට් හෝටල් ව්‍යාපෘතිය සඳහා ඉඩම් අත්කර ගැනීම :*

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ (කොට්ඨාස අංක 37, කොල්ලුපිටිය, කොළඹ මහ නගර සභා සීමාව තුළ) කොල්ලුපිටිය ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක මු.පි.කො. 10041 හා 2022.10.13 දිනැති මුලික පිඹුරේ කැබලි අංක 1 හා 2 වශයෙන් පෙන්නුම් කර ඇති හෙක්ටයාර් 0.0571 ක් පමණ වූ ඉඩම් කැබැලිවල විස්තර පහත පරිදි වේ.

01. **කැබලි අංක 1**
ඉඩමේ නම : වරිපනම් අංකය - 134/1, ගාලුපාර; වර්තමාන ඉඩම් පරිහරණය: ගෙවත්ත ස්ථිර ගොඩනැගිල්ලක කොටසක් ඇත: හිමිකම් කියන්නාගේ නම හා ලිපිනය: සෙලින්කෝ හෝම්ස් ඉන්ටර්නැෂනල් (ලෝටස් ටවර්) ලිමිටඩ්: ප්‍රමාණය: හෙක්. 0.0554.

02. **කැබලි අංක 2**
ඉඩමේ නම : වරිපනම් අංකය සොයාගත නොහැක, ගාලුපාර; වර්තමාන ඉඩම් පරිහරණය: විවෘත මුඩුබිම: හිමිකම් කියන්නාගේ නම හා ලිපිනය: සොයාගත නොහැක: ප්‍රමාණය: හෙක්. 0.0017.




*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ඉහත සඳහන් ඉඩමට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2022.12.20 වැනි දින පෙ.ව.10.00 ට තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුයි.

තවද, 2022.12.13 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම්/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

ප්‍රියන්තා දිසානායක,
ප්‍රාදේශීය ලේකම්,
තිඹිරිගස්යාය.

2022 ඔක්තෝබර් මස 27 වැනි දින,
තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දීය.

EOG 10-0308